ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ප්‍රකාශනයකි

# තේ තතු

ISSN 1391 - 6785 වෙළුම 9 කාණ්ඩය 2 2012 දෙසැම්බර්

# පරිසරය සහ තේ වගාව



'සංවර්ධනය' අද දවසේ අපේ සවනට නිතර මුසුවන වචනයක්. අප තෝරා ගෙන ඇති මේ භෞතික සංවර්ධනය තුළින්ම අප අද දවසේ ලබා ඇති ප්‍රගතියත්, ඒවා පිටුපස ඇති අනිටු ප්‍රතිඵලත් සංවර්ධිත යැයි කියනා රටවල් තුළින් ක්‍රම ක්‍රමයෙන් මතුවී පෙනේ.

අවිධිමත් සංවර්ධන ක්‍රියාවලින් තුළින් අප අවට ඇති පරිසරය උගසට තබමින් අප යන ගමන එතරම් සුබදායී නොවන බව බොහෝ අය දැන් තේරුම් ගෙන ඇති බව රහසක් නොවේ. එබැවින් තිරසාර සංවර්ධනය, ජෛව විවිධත්වය රැකගැනීම, ගෝලීය උෂ්ණත්වය පාලනය, ඕසෝන වියන රැකගැනීම, ආදී නොයෙක් සංකල්ප අප වෙතට පැමිණ ඇති බව ද පෙනේ. කෙසේ නමුත් ස්වභාවික පරිසරය පදනම් කරගෙන ඒ සමඟ අත්වැල් බැඳගත් කෘෂි කර්මාන්තයක නිරතව සිටින අපට තේ වගාව සහ පරිසරය අතර අන්‍යෝන්‍ය සබැඳියාවට දිනෙන් දින සිදුවන අකටයුතුකම් තවදුරටත් දරා සිටීමට නුපුලුවන.

වනාන්තරයක් තුළින් අප වෙත පැමිණි තේ පැළය නව තාක්ෂණික දැනුම භාවිතයෙන් කොපමණ වැඩි දියුණු කලත් එයට උරුමව තිබූ ඒ ජන්ම හිමිකම් තේ ගසට අහිමි කිරීම එතරම් නුවණැති ක්‍රියාවක් නොවේ.

වනාන්තරයෙන් පිටතට පැමිණි මිනිසා වනාන්තර කෘෂිකාර්මික බිම් බවට පරිවර්තනය කර ජීවත් වීමට සරිලන නිෂ්පාදනයක් ලබා ගත්තද, ධනය ඉපැයීම අරමුණු කරගත් කෘෂි ව්‍යාපාර කරා වගා කටයුතු පරිවර්තනය වන මෙම යුගයේ පරිසරයත් වගාවත් අතර පැවති අන්‍යෝන්‍ය සබැඳියාව රැක ගැනීම අප හමුවේ ඇති අභියෝගයකි .

පරිසරය දෙස අප විමර්ශණාත්මකව නිරීක්ෂණය කල විට එය වඩාත් හොඳින් විග්‍රහ කල හැක්කේ පද්ධතියක් ලෙස ය. පරිසර සංඝටක අතර අන්‍යෝන්‍ය සබැඳියාවන් හොඳින් පවත්වා ගනිමින්, පවතින විවිධත්වය ආරක්ෂා කර ගනිමින් හා වෙනස් වන තත්වයන්ට හැඩ ගැසෙමින් පවතින මෙම පද්ධතියට බාහිර බලපෑමක් නොමැති තාක් තිරසාරව පැවතිය හැකිවේ.

තේ වගාව සඳහා මිනිස් ක්‍රියාකාරකම් සෘජුව සම්බන්ධවන බැවින් එය ස්වභාවික පරිසර පද්ධතියක් හා පූර්ණ වශයෙන් සසැඳිය නොහැකිය. නමුදු, අපට වඩාත් සමීප ඝර්ම කලාපිය වනාන්තර පරිසරයක පොදු ලක්ෂණ තේ වගාවට සංයෝජනය කල හැකි වුව හොත්, තේ කර්මාන්තයේ පැවැත්මට හා තේ කර්මාන්තය නිසා පරිසරයට සිදු විය හැකි අහිතකර බලපෑම් වලට යම් පිළියමක් අපට ලබා ගත හැකි නොවේද?

### ලංකාවේ තේ වගාවේ විවිධත්වය

මුලින්ම අප තේ වගාව තුළ ඇති විවිධත්වය හඳුනා ගැනීමටත් එම සංඝටක අතර අන්‍යෝන්‍ය සබැඳියාව සොයා යාමටත් උත්සාහ කල හොත් තේ වගාවේ වර්තමානයේ පවතින ගැටළු රැසකට පිළිතුරු සොයා ගැනීමට හැකි වනු ඇත.

විවිධ කෘෂි දේශගුණික කලාප 23 ක් පුරා සහ විවිධ පාංශු කාණ්ඩ 21 පුරා ලංකාවේ තේ වගාව පැතිර පවතිනු දක්නට හැකිය.

ප්‍රධාන වශයෙන් චීනයෙන් ජන්මය ලැබූ කැමෙලියා සිනෙන්සිස් විශේෂය සහ උතුරු ඉන්දියාවේ ඇසෑමයෙන් අපට ලැබුණු කැමෙලියා ඇසෙමිකා යන මූලික තේ විශේෂ ස්වභාවික හෝ කෘත්‍රිම අභිජනනය මගින් දියුණු කර නව තේ ප්‍රභේද 1000 කට ආසන්න ප්‍රමාණයක් නිපදවීමට අපගේ විද්‍යාඥයන්ට හැකිවී තිබෙනවා. මේවා අතරින් තෝරා ගත් ප්‍රභේද 64 ක් පමණ දැනට වගාව සඳහා නිර්දේශ කරනු ලැබ ඇත.පවත්නා දේශගුණික කලාපයන් හා පාංශු කාණ්ඩයන්ගේ සුවිශේෂ ලක්ෂණ හොඳින් අධ්‍යයනය කර එම තත්වයන්ට වඩාත් ගැලපෙන තේ ප්‍රභේද ඒ ඒ තන්හි වගා කරන්න සැලැස්වීමෙන්, වනාන්තරයක දිගු කාලයක් පුරා සිදුවන වරණය සහ හැඩගැසීමේ ක්‍රියාවලිය අපගේ මැදිහත් වීම තුලින් සාපේක්ෂව කෙටි කාලයකින් ඉටු කර දීමට හැකිවනු ඇති.

මෙම උත්සාහය දැනටමත් තේ පර්යේෂණ ආයතනයේ අභිජනන අංශයේ විද්‍යාඥයන්ගේ අවධානයට යොමුව ක්‍රියාත්මක වෙමින් පවතින නිසා ඒවායේ සුභවාදී ප්‍රතිඵල අපට ඉදිරි කාලයේදී දක්නට ලැබෙනු ඇත.තේ වගාවේ පවතින රෝග හා පලිබෝධ හානිද විවිධය. හඳුනාගත් රෝග ප්‍රමාණය 20-25 කට නොඅඩු වන අතර පලිබෝධ හානි 30 කට (විවිධ විශේෂයන් ද සැලකූවිට 75) නොඅඩුය.

මේ රෝග පලිබෝධ පරිසරයේ තේ වගාව ආශ්‍රිතව පැවතිය ද ඒවා ගැටළුවක් බවට පත්වන්නේ ඒවාට උචිත පරිසර තත්වයක් උදා වූ විටය. එය පස, දේශගුණය, තේ ප්‍රභේදය, මිනිස් ක්‍රියාකාරකම් හෝ වෙනයම් ක්‍රියාවක් නිසා සිදු විය හැක. අප පරිසරය පිලිබඳව නිවැරදි අවබෝධයකින් හා හොඳින් ක්ෂේත්‍රය නිරීක්ෂණය කරන්නේ නම් රෝග හා පලිබෝධයන්ට ඒවාට යෝග්‍ය සාධක හමුවීම වැලැක්වීමට පුලුවන. මේ සඳහා පාංශු හා කාලගුණ තත්වයන්ගේ වෙනස්වීම් වලට අනුව රෝග හා පලිබෝධයන්ගේ හැසිරීම හොඳින් හඳුනාගෙන ගැටළුවට පෙර සූදානම් විය යුතුය.

ස්වභාවික වනාන්තරයකින් පෝෂක පදාර්ථ ඉවත්වී යාම අවම වශ සිදුවේ. නමුත් කෘෂි ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යන තේ වගා ආකාරයෙන් (ස්වභාවික වනාන්තරයක් ලෙස) පවත්වාගෙන යා නොහැක. අප තේ ඉඩමෙන් පලදාව (දලු අස්වැන්න) ඉවත් කර ගත යුතුමය.

අප තේ ඉඩමෙන් ඉවත් කර ගන්නා පදාර්ථයන්ට ප්‍රමාණයෙන් හා ගුණයෙන් ආසන්න වශයෙන් හෝ සමාන පෝෂක පදාර්ථ ප්‍රමාණයක් නැවත ඉඩමට එක් කිරීමට අප අසමත් වුවහොත් වගාවේ තිරසාර බවට එයින් දැඩි බලපෑමක් ඇති කරයි. වනාන්තරයක මෙන් පසේ සිටින හිතකර ජීවීන් උපරිම මට්ටමෙන් පවත්වාගෙන යා හැකි නම් තේ වගාවේ පැවැත්ම තවත් යහපත් වනු ඇත.




ධර්මප්‍රිය සමන්සිරි

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ප්‍රකාශනයකි

තේ තතු

ISSN 1391 - 6785 වෙළුම 9 කාණ්ඩය 2 2012 දෙසැම්බර්

මේ සඳහා හැකිතරම් දුරට පරිසරය සමඟ එක්ව යන වගා පිළිවෙත් අනුගමනය කිරීම අවශ්‍ය වේ. ඒවායින් වඩාත් වැදගත් වන්නේ

- ඉඩමෙන් ඉවත් කරන පෝෂක හැකිතරම් දුරට ඉඩමට නැවත ලබා දීම.
- පස මතු පිට කාබනික ද්‍රව්‍ය ස්ථරයක් පවත්වා ගෙන යාම.
- ඉඩමේ ශාක විවිධත්වය ප්‍රශස්ථ ලෙස පවත්වා ගෙන යාම.
- තේ ඉඩම් වල රසායන ද්‍රව්‍ය භාවිතය හැකිතාක් දුරට අවම කිරීම.

අප කොපමණ හොඳින් පෝෂක කළමණාකරණය සිදුකලත් යොදන කෘත්‍රිම පෝෂක විවිධ ආකාරයෙන් හානිවී යාම අපට මුලුමනින්ම වලක්වා ගත නොහැක. කෘත්‍රිමව යොදන සෑම පෝෂක කොටස් 100 කින් ම ගසේ පැවැත්ම හා අස්වැන්න සඳහා භාවිතාවන්නේ කොටස් 30-50 අතර ප්‍රමාණයක් වන අතර ඉතිරිය විනාශ වී යාම හෝ පහසුවෙන් ප්‍රයෝජනයට ගත නොහැකි තත්වයට පත්වේ. ඉඩමේ සිටුවන ගැඹුරු මූල පද්ධතියක් සහිත කොළ පොහොර සහ සෙවන භෝග මගින් මේ පෝෂක වලින් යම් කොටසක් නැවත පොළොව මතුපිටට ගෙන ඒම සිදු කරයි. කප්පාදු අතු වැළලීම තුළින් ද සැලකිය යුතු පෝෂක ප්‍රමාණයක් ඉඩමේ රඳවා ගැනීමට හැකිවන බව මෙහිලා සැලකිල්ලට ගත යුතුය. නමුත් මේ අප නැවත ලබා ගන්නේ තේ ගසට ලබා ගත නොහැකිව පොළොව තුළට ගමන් කල පෝෂක වලින් යම් කොටසක් පමණි. ඒ නිසා අප අස්වැන්න ලෙස ඉවත් කර ගන්නා පෝෂක ආපසු ගසට ලබා දීම පිණිස කෘත්‍රිම පොහොර යෙදීමට සිදුවේ. අප ඒ ගැන වෙනත් ආකාරයකට මෙසේ සිතුවහොත් 'දිනකට අමු දලු කිලෝ ග්‍රෑම් 20 ක් කඩන අයෙක් ඕනෑම වර්ගයක අමු කොළ කිලෝ ග්‍රෑම් 20 ක් (වියළි කොළ කි.ග්‍රෑම් 5 ක්) දිනකට එම තේ ඉඩමට යෙදුවහොත් 'තේ කොළ' ලෙස ඉවත් කරගත් පෝෂක සැලකිය යුතු ප්‍රමාණයක් ආපසු ඉඩමට ලබා දිය හැකි වෙනවා නොවේද?'